# විද්‍යාර්ථීන්ගේ ජංගම දුරකථන පණිවිඩ මෘදුකාංග භාවිතය

එල්. එන්. ලියනගේ[1]


## සංක්ෂේපය

තාක්ෂණික ඥානය හේතු කොටගෙන වේගයෙන් දියුණුව කරා ගොස් ඇති වත්මන් සමාජය තම අභිමථාර්ත මුදුන් පත් කරගැනීමෙහිලා භාවිතා කරනු ලබන ජංගම දුරකථනය මිනිස් ජීවිතයේ නැතිවම බැරි අංගයක් බවට පත්වී ඇත. ප්‍රධාන වශයෙන් ජංගම දුරකථනය පණිවිඩ හුවමාරු කිරීමට භාවිතා කරන්නකි. නූතන තාක්ෂණයේ මං පෙත් විවර කරමින් ජංගම දුරකථනය හරහා පණිවිඩ හුවමාරු කිරීමට කෙටි පණිවිඩ සේවා (Short Messaging Service – SMS) සහ විද්‍යුත් පණිවිඩ සේවා (Multimedia Messaging Service - MMS) භාවිතය ආරම්භ වුවද, මෑත කාලීනව එම සාම්ප්‍රදායික ක්‍රමවේදයන් ද අභිබවා ජංගම දුරකථන පණිවිඩ මෘදුකාංග (Mobile Messaging App – MMA) ජනතාව අතරේ සීඝ්‍රයෙන් පැතිර යමින් ජනප්‍රියත්වයට පත්ව තිබේ. දිනෙන් දින දියුණු වන නූතන තාක්ෂණයත් සමඟ ඉදිරියට ගලා යන විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ප්‍රධාන සාධකය වන විද්‍යාර්ථීන් කෙරෙහි එය කෙතරම් බලපෑමක් සිදු කර ඇත්දැයි සොයා බැලීම සඳහා මෙම පර්යේෂණය සිදු කරන ලදී. මේ සඳහා කැලණිය විශ්වවිද්‍යාලීය පීඨ 4 නියෝජනය වන පරිදි විද්‍යාර්ථීන් 100ක නියැදියක් ගෙන පරික්ෂා කල විට ඔවුන්ගෙන් 74%ක් ම සාම්ප්‍රදායික ජංගම දුරකථන පණිවිඩ ක්‍රම (SMS/MMS) වෙනුවට, ජංගම දුරකථන පණිවිඩ මෘදුකාංග (MMA) භාවිතා කරන බව මූලිකව අනාවරණය විය. එම පිරිසෙනුත් වැඩි වශයෙන් “Viber” නැමැති මෘදුකාංගය භාවිතා කරයි. ඉන්පසුව පිළිවලින් “Whatsaap”, “Line”, “Imo” ආදි ක්‍රම භාවිතය දක්නට ලැබේ. ජංගම දුරකථන පණිවිඩ මෘදුකාංග මඟින් ඡායාරූප, වීඩියෝ, විවිධ ලියකියවිලි ඇමුණුම් ආදිය අඩු වියදමකින් හුවමාරු කර ගැනීමට ඇති හැකියාව නිසාද, මෙරට තුළ පමණක් නොව විදේශ රටවල සිටින මිතුරන් සමඟද පහසුවෙන් පණිවිඩ හුවමාරු කර ගැනීමට ඇති හැකියාව නිසාද, මෙය විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් අතර වර්ධනය වී ඇත. තවද මෙම ජංගම දුරකථන පණිවිඩ මෘදුකාංගවල පවතින අර්ථාන්විතබව, ප්‍රයෝජනවත්බව, විනෝදාත්මකබව, භාවිතයේ පහසුව විද්‍යාර්ථීන්ගේ එදිනෙදා කටයුතු සාර්ථකව කර ගැනීමට විශාල සේවයක් සපයමින් පවතී .


**මුඛ්‍ය පද :** ජංගම දුරකථන, පණිවිඩ, මෘදුකාංග, විද්‍යාර්ථීන්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, lashi.navi@gmail.com